**උතුරු මැද පළාත් සභාව 2018**

-----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

උතුරු මැද පළාත් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව සහ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව උතුරු මැද පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන

නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය. මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

  මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව
--------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------------

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලාභයට එරෙහිව කපාහැරිය යුතු රු.4,395,778 ක් වූ පාඩු හා කපාහැරීම් සහ සහනාධාර ගෙවීම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ලාභයට එකතු කර දක්වා තිබුණි. | පාඩු හා කපාහැරීම් සහ සහනාධාර ගෙවීම් ලාභයට එරෙහිව කපාහැරිය යුතුවේ. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මධ්‍යම රජයේ කෘෂිකර්ම අමාත්‍යාංශය සහ නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ප්‍රේෂණය කරන ලද එකතුව රු.5,259,803 ක් වූ අක් මුදල් මූල්‍ය ප්‍රකාශනවල “ආපසු ගෙවන ලද ප්‍රදාන නොවන වෙනත් ලැබීම්” වශයෙන් වියදම් ලෙස දක්වා තිබුණි. | මෙම මුදල වෙනත් ලැබීම් ලෙස දැක්විය යුතුවේ. | අදහස් දක්වා නැත. |

1.6.2 නොසැසඳු පාලන ගිණුම්

---------------------------

පහත සඳහන් නොසැසදීම් නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------ | -------------------- |
| (අ) | පොදු තැන්පත් ගිණුමට අදාලව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් ඉදිරිපත් කර තිබුණු ශේෂ සනාථ කිරීම් සහ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශේෂයන් අතර රු.923,233 ක නොසැසඳුණු වෙනසක් විය. | ශේෂ නිවැරදිව සනාථ කරගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවේ. | අදහස් දක්වා නැත. |
| (ආ) | 2101 වාහන වැය විෂයෙහි වියදම රු.73,617,500 ක් වුවත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂය තුල වාහන මිලට ගැනීම වෙනුවෙන් ගෙවා තිබුණු මුදල රු.119,666,719 ක් වීමෙන් රු.46,049,219 ක වෙනසක් විය. | අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වලින් නිවැරදි තොරතුරු ලබාගෙන ඒවා සමඟ සැසඳීම්කර පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුවේ. | අදහස් දක්වා නැත. |

1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

-------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| --------------------- | -------------- | ------------------------------ |
| වර්ෂ 04 කට අධික කාලයක සිට පැවත එන අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 04 කට අදාළව පියවා නොතිබුණු රු.27,861,802 ක අග්‍රිම ශේෂවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් විෂයයන්ට අදාළ සියළුම සාක්ෂි විගණනයට ඉදිරිපත් කල යුතුවේ. | අදහස් දක්වා නැත. |

1.6.4 අනුකූල නොවීම

-------------------

නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|---|
| (අ) | 2013 නොවැම්බර් 28 දිනැති අංක 7/2013 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 13.1 ඡේදය | ගලෙන්බිඳුණුවැව මධ්‍ය මහා විද්‍යාලයේ 2018 වර්ෂයේ 6 වන ශ්‍රේණියට බඳවාගත් සිසුන්ගේ දෙමව්පියන් විසින් සහ පරිත්‍යාගශීලින් විසින් පාසලට ලබා දී තිබුණු පාසල් ලී බඩු හා උපකරණ අයිතම 07 කට අයත් ඒකක 439 ක් භාණ්ඩ වට්ටෝරු ලේඛනවල හෝ තොග පොත්වල ඇතුළත්කර නොතිබුණි. | 2013 නොවැම්බර් චක්‍රලේඛයේ 13.1 ඡේදය අනුව කටයුතු කල යුතුවේ. | අදහස් දක්වා නැත. |
| (ආ) | 2015 ජනවාරි 29 දිනැති අංක 5/2015 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 08 ඡේදය | ගලෙන්බිඳුණුවැව මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් දෙමව්පියන්ගෙන් රු.645,000 ක මුදලක් එකතු කර තිබුණි. | චක්‍රලේඛයේ 08 ඡේදය අනුව දෙමව්පියන්ගෙන් මුදල් එකතු කල නොහැක. | අදහස් දක්වා නැත. |

2. ආදායම් කළමනාකරණය

2.1 ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | පළාත් සභාවේ ආදායම් ගණන්දීමේ නිලධාරීන් තිදෙනෙකු යටතේ පවත්වාගෙන ගිය ආදායම් සංකේත 13 ට අදාලව 2014 – 2018 පස් අවුරුදු කාලපරිච්ඡේදය සැලකිල්ලට ගැනීමේදී පිළිවෙලින් 2014 වර්ෂයේ සහ 2018 වර්ෂවලදී ඇස්තමේන්තුගත ආදායම රුපියල් මිලියන 2,303 ක් හා රුපියල් මිලියන 3,645 ක් වූ අතර රැස්කර තිබූ ආදායම රුපියල් මිලියන 2,237 ක් හා රුපියල් මිලියන 3,231 ක් වී තිබුණි. එනම් 2014 වර්ෂයේ එකී ආදායම් සංකේත 13 ට අදාල ඇස්තමේන්තුගත ආදායමින් සියයට 97 ක් වූ තථ්‍ය ආදායම 2018 වර්ෂයේදී සියයට 89 ක් දක්වා අඩුවී තිබුණි. | වර්ෂයෙන් වර්ෂය ආදායම වර්ධනය කරගත යුතුවේ. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පළාත් සභාව විසින් 2018 වර්ෂයේදී රැස්කර තිබූ රු.288,062,379 ක් වූ උසාවි දඩ ආදායමින් සියයට 34 ක් වූ රු.98,044,158 ක මුදලක් තව දුරටත් පළාත් පාලන ආයතන 26 ක් වෙත ගෙවිය යුතුව තිබුණි. | රැස්කර ගන්නා සියළුම උසාවි දඩ ආදායම් පළාත් පාලන ආයතන වෙත ගෙවිය යුතුවේ. | අදහස් දක්වා නැත. |
| (ඇ) | පළාත් සභාව විසින් 2018 වර්ෂයේදී රැස්කර තිබුණු රු.149,739,172 ක් වූ මුද්දර ගාස්තු ආදායමින් සියයට 24 ක් වූ රු.35,231,855 ක් තව දුරටත් පළාත් පාලන ආයතන 13 ක් වෙත ගෙවිය යුතුව තිබුණි. | රැස්කර ගන්නා සියළුම මුද්දර ගාස්තු ආදායම් පළාත් පාලන ආයතන වෙත ගෙවිය යුතුවේ. | අදහස් දක්වා නැත. |
| ඈ) | 1990 අංක 13 දරන උතුරු මැද පළාතේ මුදල් ප්‍රඥප්තියේ XII වන පරිච්ඡේදයේ 40 (2) වගන්තියට ප්‍රකාරව 2018 වර්ෂයේදී නොතාරිස්වරුන් දෙදෙනෙකු විසින් අත්සන් කර තිබුණු සාධන පත්‍ර 32 ක් මත අයවිය යුතුව තිබුණු රු.728,250 ක් වූ මුද්දර ගාස්තු 2019 අප්‍රේල් මාසය වන විටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නොතාරිස්වරුන් විසින් අත්සන් කරන සියළුම සාධන පත්‍ර මත අයවිය යුතු මුද්දර ගාස්තු එම අවස්ථාවේදීම අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | අදහස් දක්වා නැත. |

03. මූල්‍ය සමාලෝචනය

-------------------------

3.1 මූල්‍ය ප්‍රතිඵලය

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.275,543,746 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.305,268,801 ක් විය.

3.2 ආදායම් හා වියදම් විචලනය

---------------------------------

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලය රු.580,812,547 කින් වර්ධනය වීමට ස්වයං උත්පාදන ආදායම සහ වෙනත් අයභාර ආදායම් පිළිවෙලින් රු.300,019,591 කින් සහ රු.97,422,281 කින් වැඩිවීමත්, පුහුණු හා ධාරිතා සංවර්ධන වියදම් සහ වෙනත් වියදම් පිළිවෙලින් රු.19,758,581 කින් සහ රු.1,252,248,581 කින් අඩුවීමත් ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

04. ප්‍රඥප්ති ගිණුම්/අරමුදල් ගිණුම්/වාණිජ අත්තිකාරම් ගිණුම් හා අනෙකුත් අත්තිකාරම් ගිණුම්

4.1 ප්‍රඥප්ති ගිණුම්/ අරමුදල් ගිණුම්

(අ) උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| i. ඉකුත් වර්ෂවල විගණන විමසුම් සහ වාර්තා මඟින් පෙන්වාදී ඇති සියළු අඩුපාඩු නිවැරදි කර ගැලපුම් සිදුනොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.796,570 ක් වූ පෙර වර්ෂ සඳහා ගැලපුම් වටිනාකම නිවැරදි නොවිය. | විගණන විමසුම් සහ වාර්තා මඟින් පෙන්වාදී ඇති සියළුම අඩුපාඩු නිවැරදි කර ගැලපුම් සිදුකල යුතුවේ. | අදහස් දක්වා නැත. |
| ii. අධිකාරිය ආරම්භ වූ වර්ෂයේ සිට උතුරු මැද පළාත් සභාවට ගෙවිය යුතුව තිබුණු රු.5,332,092 ක ශේෂයක් සහ උතුරු මැද පළාත් සභාවෙන් ලැබිය යුතුව තිබුණු රු.16,653,387 ක ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරමින් පැවතුණ අතර පළාත් සභාවේ එකඟතාවය හෝ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් නොමැතිව අධිකාරියට ලැබිය යුතු රු.16,653,387 ක ශේෂය අමාත්‍යාංශයට ගෙවිය යුතුව තිබුණු වැලි ප්‍රවාහන ආදායමට එරෙහිව සමාලෝචිත වර්ෂයේදී කපාහැර තිබුණි. එසේ වුවත් පළාත් සභාවට ගෙවිය යුතු රු.5,332,092 ක ශේෂය නිරවුල් කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | ආයතන දෙකක් අතර ඇති ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන් කපා හැරීම ආයතන දෙකේම එකඟතාවයෙන් සිදුකල යුතුවේ. | අදහස් දක්වා නැත. |

(ආ) පළාත් ප්‍රධාන අමාත්‍ය අරමුදල

| | | |
|---|---|---|
| 1992 අංක 5 දරන ප්‍රධාන අමාත්‍ය අරමුදල ප්‍රඥප්තියේ 3(1) වගන්තිය මඟින් අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ ප්‍රාග්ධනය එහි පාලක මණ්ඩලය වෙත පවරා තිබුණි. අරමුදලේ පාලක මණ්ඩලය ප්‍රධාන අමාත්‍යවරයා සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන් දෙදෙනෙකු ඇතුළු 06 දෙනෙකුගෙන් සමන්විත වූ අතර පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව අරමුදල, පවත්වාගෙන යා යුතු ක්‍රමවේදය ප්‍රඥප්තියේ දක්වා නොතිබුණු බැවින් පළාත් සභාව විසුරුවා හරිනලද දින සිට අරමුදල අක්‍රියවී තිබුණි. | පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව අරමුදල, පවත්වාගෙන යා යුතු ක්‍රමවේදය ප්‍රඥප්තියේ දක්වා තිබිය යුතුවේ. | අදහස් දක්වා නැත. |

4.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි පේෂකර්ම මධ්‍යස්ථාන 11 ක වර්ෂයකට පුහුණු කල හැකි ආධුනිකයින් සංඛ්‍යාව 61 ක් වුවත් ඉකුත් වර්ෂ 06 ක කාල පරිච්ඡේදය තුල පුහුණු කර තිබුණු ආධුනිකයින් සංඛ්‍යාවේ සාමාන්‍යය 17 ක් විය. මධ්‍යස්ථාන 09 ක ඉකුත් වර්ෂ 05 ක කාල පරිච්ඡේදය තුල පුහුණුව ලැබූ ආධුනිකයින් 66 දෙනාගෙන් 05 දෙනෙකු පමණක් පේෂකර්ම ක්ෂේත්‍රයේ රැකියාවල නිරතව තිබුණි. | උපරිම ආධුනිකයින් සංඛ්‍යාවක් පුහුණු කලයුතු අතර රැකියාවක් කිරීමට සුදුසු පුහුණුවක් ලබා දිය යුතුවේ. | අදහස් දක්වා නැත. |

05. මෙහෙයුම් සමාලෝචනය

5.1 කාර්යසාධනය

5.1.1 රජයේ ප්‍රදාන

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| උතුරු මැද පළාත් සභාව වෙත පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG), උපමාන පාදන ප්‍රදාන (CBG), විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන (අධ්‍යාපන හා සෞඛ්‍ය) යටතේ රුපියල් මිලියන 4,012.7 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණු නමුත් ඉන් වර්ෂය තුල උපයෝජනය කර තිබුණු මුදල රුපියල් මිලියන 3,089.8 ක් හෙවත් සියයට 72 ක් විය. | අනුමත ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කල යුතුවේ. | අදහස් දක්වා නැත. |

5.1.2 පළාත් සංවර්ධන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් රුපියල් මිලියන 4,600.5 ක ඇස්තමේන්තු වටිනාකමකට වූ යෝජනා 1550 ක් අනුමත කර තිබුණු නමුත් ඉන් රුපියල් මිලියන 225 ක් වූ නව වැඩ යෝජනා 107 ක් සහ අවිඡේද වැඩ යෝජනා 20 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද 2018 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 275 ක මුදලක් පළාත් සභාව විසින් වියදම් නොකර ඉතිරිකර තිබුණි. | සියළුම මුදල් සැලසුම් ප්‍රකාරව උපයෝජනය කල යුතුවේ. | අදහස් දක්වා නැත. |

5.1.3 අධ්‍යාපනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | පො/ රජරට මහා විද්‍යාලයේ උසස් පෙළ භූගෝල විද්‍යාව විෂය උගන්වන ගුරුවරයෙකු 2018 ජනවාරි 01 දින සිට ඔක්තෝබර් 27 දින දක්වා දින 96 ක් රාජකාරියට වාර්තා කර නොතිබුණු නමුත් මේ සම්බන්ධයෙන් අදාල බලධාරීන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නියමිත පරිදි රාජකාරියට වාර්තා නොකරන ගුරවරුන් සම්බන්ධයෙන් අදාල බලධාරීන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අදහස් දක්වා නැත. |
| (ආ) | පො/අඹගස්වැව මහා විද්‍යාලයේ 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා පෙනී සිටි සිසුන් 246 දෙනෙකුගෙන් සිසුන් 172 ක් හෙවත් සියයට 70 ක් අසමත් වී තිබුණු අතර පො/විජයපුර මහා විද්‍යාලයේ 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ අ.පො.ස. (සා.පෙළ) සමත් ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 52 සිට සියයට 40 දක්වා අඩු වී තිබුණි. | අධ්‍යාපන මට්ටම වර්ධනය කර ගත යුතුවේ. | අදහස් දක්වා නැත. |
| (ඇ) | සුංගාවිල මුස්ලිම් මහා විද්‍යාලයේ අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනීසිටි සිසුන් 62 කු ගෙන් 47 ක් හෙවත් සියයට 76 ක් ඉංග්‍රීසි විෂය ධාරාවද, සිසුන් 36 ක් හෙවත් සියයට 58 ක් ගණිත විෂය ධාරාවද අසමත් වී තිබුණු අතර 2017 වර්ෂයේදී වාණිජ විෂය ධාරාවෙන් අ.පො.ස(උ.පෙළ) විභාගයට පෙනීසිටි සිසුන් 08 දෙනාම සියළුම විෂයන් අසමත් වී තිබුණි. | අධ්‍යාපන මට්ටම වර්ධනය කර ගත යුතුවේ. | අදහස් දක්වා නැත. |
| (ඇ) | 2017 වර්ෂයේ අ.පො.ස (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව විජිත මධ්‍ය මහා විද්‍යාලයේ, ලංකාපුර මහා විද්‍යාලයේ සහ විජයරාජ මහා විද්‍යාලයේ ඉංග්‍රීසි විෂය අසමත් ප්‍රතිශතය සියයට 60 ඉක්මවා තිබුණි. | අධ්‍යාපන මට්ටම වර්ධනය කර ගත යුතුවේ. | අදහස් දක්වා නැත. |
| (ඉ) | ලංකාපුර මහා විද්‍යාලයේ 2017 වර්ෂයේ අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනීසිටි සිසුන් 30 දෙනෙකුගෙන් 12 ක් අ.පො.ස. (උ.පෙළ) සඳහා සුදුසුකම් ලබා නොතිබුණි. | අධ්‍යාපන මට්ටම වර්ධනය කර ගත යුතුවේ. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2014 දෙසැම්බර් 02 දිනැති අංක 31/2014 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව පාසල්වල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා වූ ඇගයීම් ක්‍රියාවලිය යටතේ, පොළොන්නරුව අධ්‍යාපන කලාපය තුළ පාසල් 35 ක් අධීක්ෂණය කල යුතුව තිබුණ ද, අධීක්ෂණය කර තිබුණේ පාසල් 08 ක් පමණි. එසේම එක් එක් කොට්ඨාශයේ පාසල් 31 බැගින් සමාලෝචිත වර්ෂය තුළ අධීක්ෂණය කල යුතු වුවද, තමන්කඩුව කොට්ඨාශයේ පාසල් 12 ක් හා ලංකාපුර කොට්ඨාශයේ පාසල් 10 ක් පමණක් අධීක්ෂණය කර තිබුණි. | 2014 දෙසැම්බර් 02 දිනැති අංක 31/2014 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව පාසල් ඇගයීම් ක්‍රියාවලිය යටතේ, අධීක්ෂණය කල යුතුවේ. | අදහස් දක්වා නැත. |
| (උ) | අ/ඉකිරිගොල්ලෑව අන්නූර් මුස්ලිම් මහ විද්‍යාලයේ විශේෂ අධ්‍යාපනය සඳහා යොමු කල යුතු තත්ත්වයේ සිටින සිසුන් 97 දෙනෙකු සාමාන්‍ය පන්ති කාමරවල අධ්‍යාපනය ලබමින් පැවතුණි. | විශේෂ අධ්‍යාපනය සඳහා යොමු කල යුතු තත්ත්වයේ සිටින සිසුන් සඳහා විශේෂ තත්ත්වයේ පංති කාමර ලබාදිය යුතුවේ. | අදහස් දක්වා නැත. |
| (ඌ) | 2003 නොවැම්බර් 07 දිනැති අංක 2003/38 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 2.1.3 ඡේදය ප්‍රකාරව ඉගැන්වීමේ නියුතු ගුරුභවතුන් විසින් සතියකට විනාඩි 40 ක කාල පරිච්ඡේද 35 ක් හා ඉගැන්වීමට අමතරව පන්ති භාරව ක්‍රියා කරන ගුරුභවතකු සාමාන්‍යයෙන් සතියකට කාලපරිච්ඡේද 33 ක් ඉගැන්වීමේ කටයුතු වල නිරත විය යුතු වුවත්, අ/ඉකිරිගොල්ලෑව අන්නූර් මුස්ලිම් මහ විද්‍යාලයේ ගුරුභවතුන් 22 ක් කාලපරිච්ඡේද 02 ත් 29 ත් අතර සංඛ්‍යාවක් පමණක් ඉගැන්වීමේ කටයුතුවල නිරත වී තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කල යුතුවේ. | අදහස් දක්වා නැත. |

5.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන භාණ්ඩාගාර ලේකම්ගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 (අ) ඡේදය ප්‍රකාරව අපහරණය කිරීමට හදුනාගත් වාහන 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය මගින් ලබාදි ඇති උපදෙස් අනුව 2018 ජූලි 30 දිනට පෙර අපහරණයකර අවසන් කලයුතු වුවත්, පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | අදහස් දක්වා නැත. |

විසින් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අපහරණය සඳහා හඳුනාගත් වාහන 37 ක් 2018 දෙසැම්බර් 04 දින වන විටත් අපහරණය කර අවසන් කිරීමට අපොහොසත් වී තිබුණි. එමෙන්ම එකී වාහන අනාරක්ෂිතව දිරාපත්වීමට ඉඩහැරීම නිසා වෙන්දේසි කිරීම තුලින් ලබා ගත හැකි මූල්‍ය වටිනාකම තව දුරටත් හීන වෙමින් පැවතුණි.

## 5.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛනවලට අනුව වකුගඩු ආසාදන තත්ත්වයෙන් පෙලෙන රෝගීන්ගෙන් සියයට 60 ක් පිරිමින් වන නමුත් උතුරු මැද පළාතේ ක්‍රියාත්මකවන වකුගඩු රෝග නිවාරණ වැඩසටහනේ අකාර්යක්ෂමතාව නිසා සායනවලට සහභාගී වන පිරිමින්ගේ ප්‍රතිශතය සියයට 25 ක් විය. | වකුගඩු ආසාදන තත්ත්වයෙන් පෙලෙන සියළුම රෝගීන් සායනවලට සහභාගී කරවා ගත යුතුවේ. | පිළිතුරු ලබා දී නැත. |
| (ආ) | සෞඛ්‍ය සේවාව කාර්යක්ෂමව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් රෝහල් 03 ක බාහිර රෝගී අංශ ජාලගත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව 2012 සහ 2017 වර්ෂවලදී ශක්‍යතා අධ්‍යනයකින් සහ නිලධාරීන් පුහුණු කිරීමකින් තොරව උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වටිනාකම රු.12,349,783 ක පරිගණක මෘදුකාංග හා අමතර කොටස් ලබාදී තිබුණු නමුත්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි. මිලටගෙන තිබුණු පරිගණක මෘදුකාංග හා අමතර කොටස්වලින් රු.9,684,543 ක් වූ ප්‍රමාණයක් තාක්ෂණික වශයෙන් යල් පැන ගොස් තිබුණු අතර අපේක්ෂිත අරමුණ ඉටුනොවීමෙන් වියදම නිශ්කාර්යය වී තිබුණි. | ව්‍යාපෘතිය නොපමාව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කල යුතුවේ. | පිළිතුරු ලැබී නැත |
| (ඇ) | කැබිතිගොල්ලෑව සෞඛ්‍ය බල ප්‍රදේශයේ වකුගඩු රෝගීන්ට කිලෝමීටර් 65 ක දුරක් ගෙවා අනුරාධපුර ශික්ෂණ රෝහල වෙත පැමිණ රුධිර කාන්දුකරණය (Dialysis) කරගැනීමේදී සිදුවන අති දුෂ්කරතාවය මගහරවා ගැනීම සඳහා කැබිතිගොල්ලෑව මූලික රෝහලේ රුධිර කාන්දුකරණ ඒකකයක් ඉදිකිරීම වෙනුවෙන් 2016 වර්ෂයේදී රු.1,374,228 ක මුදලක් පළාත් සෞඛ්‍ය සේවා | විශේෂඥ වෛද්‍යවරයෙකු ඇතුළු කාර්ය මණ්ඩලය සපයා රුධිර කාන්දුකරණ ඒකකය නිසි ලෙස උපයෝජනය කලයුතුවේ. | පිළිගනිමි. කාර්ය මණ්ඩලයේ හිඟකම නිසා යන්ත්‍ර භාවිතයට ගැනීමට නොහැකි වී රජයට පාඩුවක් සිදුවී ඇති බවත්, කාර්ය මණ්ඩලය ලබාගැනීම |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණි. එමෙන්ම මෙම ඒකකය සඳහා අවශ්‍ය රුධිර කාන්දුකරණ පෙරණ යන්ත්‍ර 04 ක්, ඇඳන් 04 ක් සහ RO ජල පෙරණ පද්ධතියක් ඇතුළු උපාංග වෙනුවෙන් රුපියල් මිලියන 10 කට අධික මුදලක් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින්ද වැය කර තිබුණු අතර රුධිර කාන්දු කරන යන්ත්‍ර ආරක්ෂා කිරීම සහ රුධිර කාන්දුකරණ ඒකකය අඛන්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා අධිබලැති විදුලි උත්පාදන යන්ත්‍රයක්ද ලබාදී තිබුණි. අඛණ්ඩව වායුසමීකරණ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා වර්ෂ 02 කට අධික කාලයක් විදුලිය වෙනුවෙන් අධික වියදමක් දරා ඇතත් විශේෂඥ වෛද්‍යවරයෙකු ඇතුළු කාර්ය මණ්ඩලයක් නොමැතිවීම නිසා රුධිර කාන්දුකරණ ඒකකය නිෂ්කාර්යව පැවතුණි. දිනකට වකුගඩු රෝගීන් 16 දෙනෙකුගේ රුධිර කාන්දුකරණය කිරීමට හැකි මෙම ඒකකය නිෂ්ක්‍රියව පැවති කාලය තුළ වකුගඩු රෝගීන් සඳහා වාර 11,680 ක් රුධිර කාන්දුකරණය (Dialysis) කිරීමේ හැකියාව අහිමි වී ගොස් තිබුණි. | | පාලනයෙන් බැහැර කරුණක් ලෙස පෙන්වා දෙමි. |
| (ඇ) | 1984 වර්ෂයේ මධ්‍යම බෙහෙත් ශාලාවක් (Dispensary) ලෙස ආරම්භකර 2015 පෙබරවාරි මාසයේ සිට "C" ශ්‍රේණියේ ප්‍රාදේශීය රෝහලක් ලෙස සංවර්ධනය කල වාහල්කඩ රෝහලෙහි ඇඳන් 17 ක් සහිත වාට්ටු සංකීර්ණයක් ඉදිකර, නේවාසික ප්‍රතිකාර කිරීම් ආරම්භ කර තිබුණි. එමෙන්ම රෝහල් භූමියේ වෛද්‍ය නිල නිවාසයක්, සෞඛ්‍ය සේවිකාවන් සඳහා නිල නිවාස 02 ක්, රියදුරු නිල නිවාසයක් ඇතුළු පහසුකම් ද සපයා තිබුණි. එසේ වුවත්, ප්‍රදේශයේ රෝගී ජනතාව වෙත ඵලදායී සෞඛ්‍ය සේවාවක් සඳහා අවශ්‍ය මානව සම්පත් සපයා නොතිබීම නිසා එකී ප්‍රාදේශීය රෝහල නැවත මධ්‍යම බෙහෙත් ශාලාවක (Dispensary) තත්ත්වයෙන් ක්‍රියාත්මක වෙමින් පැවති අතර ගොඩනැගිලි හා උපකරණද විනාශ වෙමින් පැවතුණි. | අවශ්‍ය පහසුකම් සපයා රෝගීන්ට හොඳ සෞඛ්‍ය සේවයක් ලබා දිය යුතුවේ. | පිළිගනිමි. කාර්ය මණ්ඩල අවශ්‍යතා රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සිදුකරන අතර, කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් පරිදි නොලැබීම නිසා මෙම තත්ත්වය උදාවී ඇත. |

5.4 දෘෂ්‍ය අක්‍රමිකතා

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| උතුරු මැද පළාතේ සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය උදෙසා තාක්ෂණික ප්‍රමිතියෙන් යුතු වාර්තාමය වීඩියෝ වැඩ සටහනක් සකස් කිරීම, ආකර්ශණීය පින්තූර සහිත ප්‍රමිතියෙන් යුතු පොතක් නිර්මාණය කිරීම සහ විධිමත් තොරතුරු සහිත වෙබ් අඩවියක් නිර්මාණය කිරීම වෙනුවෙන් ප්‍රධාන ලේකම් විසින් සැපයුම්කරුවෙකු සමඟ රු.15,797,500 ක මුදලකට 2016 මාර්තු 23 දින ඇතිකරගත් ගිවිසුම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයක් වන සංචාරක ආකර්ශනයකින් යුතු වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා සැපයුම්කරුට ඇති සුදුසුකම් හා/හෝ මීට ප්‍රථමයෙන් නිර්මාණය කරන ලද වෙබ් අඩවිවල විස්තර හෝ ලබා නොගෙන හා විවෘත ලංසු කැඳවීමෙන්ද තොරව සැපයුම්කරු තෝරාගෙන තිබුණි. අවම වශයෙන් මෙම සැපයුම්කරුගේ යැයි දක්වා තිබුණු වෙබ් අඩවියද ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කල යුතුවේ. | අදහස් දක්වා නැත. |
| (ii) ගිවිසුම්ගත මුදලින් රු.12,144,500 ක් 2016 දෙසැම්බර් 26 දින වන විට ගෙවා තිබුණු නමුත් 2019 සැප්තැම්බර් 18 දින තෙක් සැපයුම්කරු විසින් මෙම ව්‍යාපෘතිය අවසන් කර පළාත් සභාව වෙත භාරදී නොතිබුණි. | සැපයුම්කරු විසින් අදාල සැපයුම සිදුකිරීමෙන් පසුව පමණක් ගෙවීම් කලයුතුවේ. | අදහස් දක්වා නැත. |
| (iii) ව්‍යාපෘතිය අවසන් කලයුතු දිනය දක්වා නොතිබීම, ගිවිසුමේ කොන්දේසි ඉදිරියෙන් දෙපාර්ශවය අත්සන්කර නොතිබීම ඇතුළු විවිධ අඩුපාඩු ගිවිසුමේ පැවතීම නිසා සැපයුම්කරුට එරෙහිව නීතිමය පියවර ගැනීමටද නොහැකි වී තිබුණි. | ගිවිසුම් ගතවීම නිවැරදිව සිදුකල යුතුවේ. | අදහස් දක්වා නැත. |

5.5 හඳුනාගන්නා ලද පාඩු

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් සංවර්ධනය කර තිබුණු පොළොන්නරුව දීප උයන ව්‍යාපෘතියේ වර්ග මීටර් 10,211 ක තණ පිඩලි ඇතිරීම | ඉටුකල වැඩවලට පමණක් ගෙවිය යුතුවේ. | වර්ග මීටර් 10,211 ක සම්පූර්ණ ප්‍රමාණයේම තණ පිඩලි ඇතිරීම |

| | | |
|---|---|---|
| සඳහා රු.26,548,626 ක් ගෙවා තිබුණි. තණ පිඩලි අතුරා තිබුණු භූමි ප්‍රමාණයට අදාලව මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කල අනුරේඛනය අනුව එහි වර්ග ප්‍රමාණය වර්ග මීටර් 9366 ක් විය. ඒ අනුව ගෙවිය යුතු මුදල රු.24,351,609 ක් වීමෙන් වැඩිපුර ගෙවා තිබුණු මුදල රු.2,197,027 ක් විය. | | සිදුකල නමුත් කෙටි කලකින් ඉන් වර්ග මීටර් 845 ක ප්‍රමාණයක තණ පිඩලි වියලී ගොස් ඇත. |

5.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු
-------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | දෙවන සෞඛ්‍ය ආංශික සංවර්ධන ව්‍යාපෘති (SHSDP) ප්‍රතිපාදන යටතේ උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සඳහා ඉදිරි වර්ෂ 25 කට ප්‍රමාණවත් ධාරිතාවයෙන් යුත් වර්ග අඩි 2500 ක නව තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම රු.59,546,072 ක මුදලකට 2017 පෙබරවාරි 15 දින කොන්ත්‍රාත් ආයතනයකට පවරා තිබුණි.<br><br>(i) පසුව එය සත්මහල් ගොඩනැගිල්ලක් ලෙස ඉදිකිරීමට තීරණයකර අදියර 1 ලෙස ගොඩනැගිල්ලේ පළමු මහල දක්වා වූ මූලික ඉදිකිරීම් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන්ද බැහැරව පළමු කොන්ත්‍රාත්කරුටම පළමු ගිවිසුම්ගත මුදලට භාරදී තිබුණි. ඒ අනුව 2018 සැප්තැම්බර් 15 දින අවසන් කිරීමට උපදෙස් දී පසුව 2018 දෙසැම්බර් 15 දින දක්වා කල්දිගු ලබාදී තිබුණි.එසේ 2018 දෙසැම්බර් 15 දින දක්වා කල්දිගු ලබාදී තිබියදී සහ කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් නිමකර භාරදීමට පෙර එනම් 2018 නොවැම්බර් 14 දින ගොඩනැගිල්ලේ II - A අදියරේ ඉදිකිරීම් රු.17,337,504 ක මුදලකට දින 40 ක අසාමාන්‍ය කාලයක් තුළ අවසන් කිරීම සඳහා වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම්ගතව තිබුණි. ඒ අනුව II - A අදියරේ ඉදිකිරීම් ආරම්භ කිරීම සඳහා 1 අදියරේ ඉදිකිරීම් කඩිනම් කළ යුතු බැවින් කොන්ක්‍රීට් ශක්තිමත් කිරීමට රු.185,310 ක අතිරේක වියදමක් දරා තිබුණි. | ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීමත්, මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල නොකිරීමත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශය න් අනුගමනය නොකිරීමත් මෙම තත්ත්වයට හේතු වී ඇති බැවින් ව්‍යාපෘතිය ආරම්භයේ සිට අවසානය දක්වා විධිමත් සැලැස්මකට අනුව ක්‍රියාත්මක කළයුතුවේ. | පිළිගනිමි.<br><br>ගොඩනැගිල්ලේ පූර්ණ අධීක්ෂණය පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවට පවරා තිබුණු බැවින් වැඩිදුර විස්තර එම දෙපාර්තමේන්තුවෙන් ලබාගත යුතුවේ. |
| | ii. ප්‍රසම්පාදනයේ දුර්වලතා සහ පිළිගත නොහැකි හේතුන්මත කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම නිසා I අදියර වෙනුවෙන් මිල | සැලසුම් කිරීම, ඇස්තමේන්තු සැකසීම සහ | පිළිගනිමි.<br><br>වාර්ෂිකව ලැබෙන මුදල් ප්‍රමාණය සැලකිල්ලට ගෙන |

| | | |
|---|---|---|
| විචලනය ලෙස රු.4,185,040 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට සිදුවී තිබුණි. මෙම ගොඩනැගිල්ලේ සැලසුම් කිරීමේ සහ ඇස්තමේන්තු කිරීමේ දුර්වලතා නිසා සියයට 10 ක අවිනිශ්චිත ගෙවීම් සීමාවද ඉක්මවා තිබුණු අතර, පළමු මහලේ කොන්ක්‍රීට් තට්ටුව පුළුල් කිරීම සඳහා රු.3,960,196 ක මුදලක් සහ අතිරේක වහළක් ඉදිකිරීම සඳහා තවත් විශාල මුදලක්ද වැය කළ යුතුව තිබුණි. | ක්‍රියාත්මක කිරීම විධිමත් අයුරින් සිදුකළ යුතුවේ. | ඉදිකිරීම් සිදුකරන අතර, ව්‍යාපෘතියේ පූර්ණ අධීක්ෂණය පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් සිදු කෙරේ. |
| (iii) එමෙන්ම ඉදිකිරීම්වල දුර්වලතා පැවති අතර, ඇස්තමේන්තු සැකසීමේ නොසැලකිලිමත්භාවය නිසා බැහැර වූ වැඩ විෂයයන් අතිරේක වැඩ වශයෙන් ඉටු කිරීමේදී කොන්ක්‍රීට් ඝනමීටර් 438.9 ක් වෙනුවෙන් ගිවිසුම්ගත රේටය ඉක්මවා රු.1,245,595 ක මුදලක් ද වැඩිපුර ගෙවා තිබුණි. | ඇස්තමේන්තු සැකසීම නිවැරදිව කළ යුතුවේ. | පිළිතුරු ලබාදිය නොහැක. සියළු සැලසුම් පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත. |
| (ආ) පලුගස්දමන සමන්තිලක මහතාගේ නිවස අසල සිට සිංහපුර ප්‍රධාන මාර්ගය දක්වා කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.11,194,750 ක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) කිලෝ මීටර් 01 ක් වූ මෙම මාර්ගයේ වැඩ කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය බව දක්වමින් අදියර 03 කට බෙදා වෙන්කර තිබුණි. එසේ වුවත් එක් එක් අදියර සඳහා ලංසු කැඳවීම 2017 අගෝස්තු 08 දින හා 2017 සැප්තැම්බර් 26 දින දක්වා සති 07 ක කාල පරතරයක් සහිතවද, ගිවිසුම් ගතවීම 2017 සැප්තැම්බර් 04 දින හා 2017 නොවැම්බර් 29 දින දක්වා සති 12 ක කාල පරතරයක් සහිතවද සිදුකර තිබුණි. එමනිසා 2018 මාර්තු වනවිට මෙම මාර්ගයේ වැඩ නිමකර ජනතාවගේ ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කල යුතුවේ. | පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇත. වාර්තාව ලැබීමෙන් පසු පිළිතුරු ඉදිරිපත් කරමි. |
| (ii) පළමු අදියරේදී ඉටුකල වැඩවලට වඩා රු.45,672 ක් වැඩිපුර ගෙවා තිබුණි. | මෙම මුදල අයකල යුතුවේ. | - එම - |
| (iii) කුට්ටිගල්වල දරා ගැනීමේ ශක්තිය අවම වශයෙන් 25 $N/mm^2$ වියයුතු වුවද අදියර 03 න් ස්ථාන 03 කින් ලබාගෙන පරීක්ෂාකල කුට්ටි ගල් 21 කින් කුට්ටිගල් 11 කම ශක්තිය ප්‍රමිත දරා ගැනීමේ ශක්තියට වඩා අඩුබව තත්ත්ව පාලන වාර්තාවලින් තහවුරු විය. | නියමිත ප්‍රමිතියේ ගල් යොදා නැවත ඉදිකල යුතුවේ. | - එම - |

5.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
----------------------------

5.7.1 ප්‍රමාද වූ ව්‍යාපෘති
------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ තිරප්පනේ මහානාම විද්‍යාලයේ තෙමහල් පන්ති කාමර ගොඩනැඟිල්ල හා ප්‍රාථමික විද්‍යහලේ දෙමහල් ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය ඉදි කිරීමට අදාලව රු.41,451,986 ක වටිනාකමට 2017 මාර්තු 13 දින ගිවිසුම්ගත වී තිබුණු අතර 2017 සැප්තැම්බර් 13 දිනට ප්‍රථම අවසන්කල යුතු විය. 2017 මාර්තු 13 දින රු.14,300,935 ක් වූ සියයට 30 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණු නමුත් 2019 ජනවාරි 18 දින වනවිට භෞතික ප්‍රගතිය සියයට 5 ක් ව පැවති අතර අත්තිකාරම් සුරක්ෂණයේ කාලයද අවසන් වී තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව භෞතික ප්‍රගතිය අත්කර ගත යුතුවේ. | අදහස් දක්වා නැත. |
| (ආ) | ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ තිරප්පනේ මහානාම විද්‍යාලයේ ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම සඳහා 2016 දෙසැම්බර් 12 දින ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් රු.21,581,698 ක වටිනාකමකට කොන්ත්‍රාත් ආයතනයක් සමග ගිවිසුම්ගතව තිබුණි. ක්‍රීඩාපිටිය ඉදිකිරීම සඳහා පොළොවෙන් මතුපිට පස් ඉවත්කර Structural Level ගැනීමකින් තොරව ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙලකර තිබුණි. | ඉංජිනේරු ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කලයුතුවේ. | අදහස් දක්වා නැත. |

5.7.2 අත්හැර දැමූ ව්‍යාපෘති
-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| උතුරු මැද පළාතේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ඉංජිනේරුමය කාර්යයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රුපියල් මිලියන 1,777 ක ව්‍යාපෘති 473 ක් වෙනුවෙන් ව්‍යාපෘති සැලසුම් සැකසීම, ඉංජිනේරු ඇස්තමේන්තු සැකසීම ඇතුළු ඉංජිනේරුමය උපදේශක සේවාවලට අදාළ මූලික කටයුතු සිදුකර තිබුණි. එසේ වුවත්, ඉන් රුපියල් මිලියන 977 ක්වූ ව්‍යාපෘති 192 ක් අතහැර දමා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණේ වටිනාකම රුපියල් මිලියන 800 ක් වූ ව්‍යාපෘති 281 ක් පමණි. | ක්‍රියාත්මක කලයුතු ඉංජිනේරුමය කාර්යයන් වෙනුවෙන් පමණක් ව්‍යාපෘති සැලසුම් සැකසීම, ඉංජිනේරු ඇස්තමේන්තු සැකසීම යනාදිය සිදුකල යුතුවේ. | අදහස් දක්වා නැත. |

5.7.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Out Come) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| (අ) උතුරු මැද පළාතේ සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2016 වර්ෂයේ මැයි සහ ජුනි මාස වලදී මිලට ගෙන තිබුණු රු.1,000,000 ක් වටිනා Self-operated Information Machine 05 ක් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) මෙම යන්ත්‍රවල වර්ෂ එකක් වූ වගකීම් කාලය 2017 ජුනි 04 දිනෙන් අවසන් වී තිබුණු නමුත් 2018 ජනවාරි වන තෙක්ම එකී යන්ත්‍ර 05 න් යන්ත්‍ර 03 ක් ම ගබඩාවේ රඳවාගෙන තිබුණි. ඉතිරි යන්ත්‍ර දෙක (02) 2017 පෙබරවාරි මාසයේදී සවිකර තිබුණි. | අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන ප්‍රසම්පාදනයන් සිදුකල යුතුවේ. | යන්ත්‍රවල වගකීම් කාලය 2017 ජුනි 04 දින අවසන් වුවද ඉන්පසුව නොමිලේ සේවාවන් 04 ක් සිදුකර ඇති බව සඳහන් කරමි. |
| (ii) 2018 නොවැම්බර් වන විට මෙම සියළුම යන්ත්‍ර අක්‍රීය තත්ත්වයේ පැවති බැවින් යන්ත්‍ර මිලට ගැනීම සඳහා ගෙවා තිබුණු රු.1,000,000 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | මෙම මුදල වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකල යුතුවේ. | අනුරාධපුර හා පොළොන්නරුව දුම්රිය ස්ථානවල යන්ත්‍ර 02 ක් සවි කිරීමට යෝජිතව තිබුණු නමුත් ආරක්ෂාව පිළිබඳ ගැටළුව නිසා මෙම යන්ත්‍ර 02 ප්‍රධාන ලේකම් කාර්යාලයේ සහ ප්‍රධාන අමාත්‍යාංශයේ ස්ථානගත කර ඇත. |
| (ආ) 2000 වර්ෂයේදී කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය රෝහල, මූලික රෝහලක් බවට පත්කර විශේෂඥ වෛද්‍ය සේවාවන් ද ක්‍රියාත්මක කලහැකි ලෙස අවශ්‍ය ගොඩනැගිලි සහ වෛද්‍ය උපකරණ සපයා තිබුණි. එසේ වුවත් මේ දක්වා රෝහලට අවශ්‍ය වකුගඩු රෝග, ප්‍රසව හා නාරිවේදය, කායික රෝග සහ ළමා රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන්ගේ සේවය නොලැබීම නිසා ඉදිකර තිබූ ගොඩනැගිලි සහ CT ස්කෑන් යන්ත්‍රය වැනි වෛද්‍ය උපකරණ ඌණ උපයෝජිතව පැවතුණි. එමෙන්ම ඉහත තත්ත්වය මත එකී අංශ වෙතින් ලැබියයුතු සේවය නොලැබීම නිසා ප්‍රදේශවාසී ජනතාවට අනුරාධපුරය / වවුනියාව නගරවල පිහිටි රෝහල් වෙත ගොස් ප්‍රතිකාර ලබාගැනීමට සිදුවී තිබුණි. | අවශ්‍ය මානව සම්පත් සපුරා රෝහලේ සියළු වෛද්‍ය උපකරණ ඇතුළු ගොඩනැගිලි භාවිතයට ගෙන පූර්ණ වෛද්‍ය සේවාවක් ජනතාවට ලබාදිය යුතුවේ. | පිළිගනිමි. විශේෂඥ වෛද්‍යවරුන් ප්‍රමාණවත් පරිදි රේඛීය අමාත්‍යාංශය විසින් ලබා නොදීම මෙම තත්ත්වයට හේතු වී ඇත. |

5.8 වත්කම් කළමනාකරණය

-------------------------------

නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේදී උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 02 ක් ගෙවා මිලට ගෙන තිබුණු කසළ දාහක යන්ත්‍රය, 2017 අගෝස්තු 08 දින කැබිතිගොල්ලෑව මූලික රෝහල වෙත ලබාදී තිබුණි. එසේ වුවත් මෙම යන්ත්‍රය එදින සිට 2019 ජනවාරි 10 දින වනවිටත් භාවිතයට නොගෙන ඇසුරුම් තුළම නිෂ්ක්‍රීයව පැවතුණි. | අවශ්‍යතාවයට සිරිලන ප්‍රමිතියෙන් යුතු භාණ්ඩ මිලදී ගෙන භාවිතයට ගත යුතුවේ. | පිළිතුරු ලබා දී නැත. |
| (ආ) | බර්ටි ප්‍රේමලාල් පදනම විසින් පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණු සියළු පහසුකම් සහිත සුව මහ ජංගම සායන රථය වාහන සේවා මධ්‍යස්ථාන භූමියේ වර්ෂ 02 කට අධික කාලයක සිට නිෂ්ක්‍රීයව ගාල්කර තිබුණි. | උපයෝජනය කිරීමට කටයුතු කලයුතුවේ. | අදහස් දක්වා නැත. |
| (ඇ) | පො/බැදිවැව මහා විද්‍යාලයේ පුස්තකාල පොත්, ගුණාත්මක යෙදවුම්, පාසල් පාදක යෙදවුම් මිලට ගැනීම සඳහා ලැබී තිබුණු රු.613,909 ක මුදලක්ද පො/සේවා මුක්ත විද්‍යාලයට ලැබී තිබුණු රු.243,000 ක මුදලක්ද ජංගම ගිණුම්වල නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි. | පාසල්වලට ලැබෙන මුදල් උපයෝජනය කල යුතුවේ. | අදහස් දක්වා නැත. |
| (ඈ) | 2009 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල ධාවනයෙන් ඉවත් කර ඇති වාහන 06 ක් සම්බන්ධයෙන් 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු නොකර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු භූමිය තුල ස්වභාවික ආපදාවන්ට ලක්වන ආකාරයෙන් අනාරක්ෂිතව ගාල් කර තිබුණි. | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | අදහස් දක්වා නැත. |

5.9 කාර්ය මණ්ඩල පරිපාලනය

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 647 ක් සහ තථ්‍ය කාර්ය මණ්ඩලය 481 වීමෙන් පුරප්පාඩු 166 ක් විය. | දෙපාර්තමේන්තු කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා ඌණ කාර්ය මණ්ඩල අවශ්‍යතා සපුරාගත යුතුවේ. | පුරප්පාඩු තනතුරු සඳහා බඳවාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ආ) | පළාත් සභාවේ පාසල් කාර්යය මණ්ඩලය තුල 1,087 ක් වූ අනුමත විදුහල්පති කාර්යය මණ්ඩලයේ 311 කද, 16,830 ක්වූ අනුමත ගුරු කාර්යය මණ්ඩලයේ 747 කද පුරප්පාඩු පැවතුණි. | පළාතේ අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීම සඳහා පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුවේ. | අදහස් දක්වා නැත. |

5.10 ප්‍රසම්පාදනය

5.10.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන 35 කින් 32 ක් 2018 වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව සියළුම ආයතන විසින් ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කල යුතුවේ. | අදහස් දක්වා නැත. |

06. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

6.1 ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභාව සහ එහි අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන 34 ක් විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව සියළුම ආයතන විසින් ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කල යුතුවේ. | අදහස් දක්වා නැත. |